# රතු හා රතු

අප රතු පාට මලක් දැක ගන්නේ කෙසේ ද? බටහිර භෞතික විද්‍යාවෙහි මේ සම්බන්ධයෙන් කෙරෙන විස්තරයට අනුව මලෙන් පරාවර්තනය වී ලැබෙන ආලෝකය, එනම් විද්‍යුත් චුම්බක විකිරණ, ඇසේ කාචය තුළින් දෘෂ්ටි විතානයට ගොස් ඉන් පසු ස්නායු ඔස්සේ ඇති කෙරෙන දැනුමෙන් අපට රතු පාට මල දැක ගත හැකි ය. මෙහි දී මල යන්න අපෙන් තොරව වාස්තවික ව පවතින බව උපකල්පනය කෙරී ඇති අතර, ඉන් ඇති කෙරෙන සංජානනය ඔස්සේ අපට සංකල්පයක් ඇති වන බව ද කියැවෙයි. මේ දෙවියන් වහන්සේ මවා ඇති මල (එය භෞතික ද යන්න මෙහි දී ප්‍රශ්නය නොවේ. භෞතික පැවැත්ම පිළිබඳ අදහස ම බටහිර සංස්කෘතිය තුළ ඇත්තේ දෙවියන් වහන්සේ විසින් මවන ලද යන්න පදනම් කරගනිමිනි. දේව නිර්මාණය නොපිළිගැනෙන්නේ නම් මහා පිපිරුම වැනි සිදු නොවිය හැකි අභව්‍ය සිද්ධියක් ඔස්සේ සිදු වූ විකාශයක ප්‍රතිඵලයක් ලෙස මල බිහි වී ඇත යන්න එහි දී පිළිගැනෙයි. එහෙත් මහා පිපිරුම හා දේව නිර්මාණය අතර එතරම් වෙනසක් නැත. මහා පිපිරුම යනු දෙවියන් වහන්සේ නොමැතිව කෙරෙන, එහෙත් යම් ආකාරයකින් සිදු කෙරෙන නිර්මාණයකි.) අපෙන් තොරව පවතියි. මලට ඒ ඒ භාෂාවෙන් කුමක් කීව ද, (එය මල හෝ ෆ්ලවර් හෝ වෙනත් ශබ්ද මාලාවක් විය හැකි ය) අවසානයේ දී සොසූර් විද්වතා සඳහන් කරන ප්‍රඥප්තයක් (රෙෆරන්ට්) මල පිටුපස වෙයි.

සොසූර් විද්වතා හා පශ්චාත්ව්‍යුහවාදීන් හා ඊනියා පශ්චාත්නූතනවාදීන් කුමක් කීව ද, ඔවුහු අවසානයේ දී මේ ඊනියා වාස්තවික ප්‍රඥප්තයක ඇලී ගැලී සිටිති. ඔවුන්ගේ සංඥායකය හා සංඥායිතය යන්න මේ ප්‍රඥප්තයෙන්, එනම් කලින් සඳහන් ව ඇති ආකාරයට වාස්තවික වූ බලු බල්ලාගෙන්, එනම් වාස්තවික මලෙන් ගලා එන්නා වූ අදහස් ය. සංඥායකය බටහිර භෞතික විද්‍යාඥයාගේ ආලෝක කිරණ ඔස්සේ එයි. එය වචනයක් හෝ වෙනත් ශබ්ද මාලාවක් වී නම් ආලෝක තරංග වෙනුවට ශබ්ද තරංග ඔස්සේ එයි. සංඥායකය මනසෙන් තොරව සිදුවන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. මේ සංඥායකය හේතුකොටගෙන සංඥායිතයක් ඇතිවන්නේ යැයි සොසූර් විද්වතා කියයි. සංඥායකය මනසින් තොරව සිදු වුව ද සංඥායිතය මනසට දැනෙයි. එසේ නැතිව රතු, රතු පාට වන්නේවත් බල්ලා යන ශබ්ද මාලාව බල්ලා යන්න හඟවන්නේවත් නැත. බල්ලා යන ශබ්ද මාලාව සොසූර් විද්වතා හා අනෙකුත් පශ්චාත්ව්‍යුහවාදීන්ට හා පශ්චාත්නූතනවාදීන්ට අනුව මනසින් තොරව ඇති වෙයි.

මෙය සම්පූර්ණයෙන් ම වැරදි ය. සොසූර් විද්වතා හා අනෙක් එවැන්නන් වරද්දා ගන්නා තැන මෙතන ය. මෙරට සිටින අනුකාරකයන්ට නම් මේ කිසිවක් නොතේරෙයි. බල්ලා යන ශබ්ද මාලාව යනු හුදු ශබ්ද මාලාවක් නොවේ. එය මිනිසුන්ට ඇසෙන ශබ්ද මාලාවකි. බල්ලා යන ශබ්ද මාලාව අසන්නට කෙනෙක් ඇත. එය කැසට් පටයක හෝ වෙනත් එවැන්නක පටිගත වන ශබ්ද මාලාවක් නොවේ. එවැනි ශබ්ද මාලා වාස්තවික යැයි මෙයින් නිගමනය නොවේ. ඒ කෙසේ වෙතත් බල්ලා යන ශබ්ද මාලාව ඇසෙන්නේ බල්ලා යන සංකල්පය ද මනසේ සනිටුහන් කරමිනි. ඒ සංකල්පය නැත්නම් බල්ලා යන ශබ්ද මාලාව ඒ අසන සිංහලයකුට වුව ද, වෙනත් ශබ්ද මාලාවක් බවට පත්වෙයි. මෙහි දී කිවයුත්තේ හුදු ඝෝෂාවක් යැයි අප ඇතැම් විට හඳුන්වන ශබ්ද මාලා පවා ඒ ඝෝෂාව යන සංකල්පය මනසේ ජනිත කරයි. ඒ ඝෝෂාව පිළිබඳ හෝ සංකල්පය නොමැති ව, අපට ඝෝෂාව යන්න අර්ථ නොදැක්වෙයි. කෙටියෙන් කිවහොත් අපට ඝෝෂාව යන සංකල්පය නොමැතිව ඝෝෂාවක් නොඇසෙයි.

සියළු සංජානන අපට ලැබෙන්නේ සංකල්ප සමගිනි. සංකල්පයකින් තොර සංජානනයක් මිනිස් මනසට ගෝචර නොවේ. මනස හා කැමරාව වැනි වස්තුවක් හෝ ශබ්ද පටයක් හෝ අතර ඇති වෙනස ද එය ය. කැමරාවට ආලෝක කිරණ ලැබුණ ද, එනම් සන්නිවේදනය වුව ද, කැමරාවට මනසක් නැති බැවින් සංකල්ප නිර්මාණය කර ගැනීමට නොහැකි වීමෙන් සංජානන ද නැත. වචන පමණක් නොව ඕනෑම ශබ්ද මාලාවක් අපට ඇසෙන්නේ ඒ පිළිබඳ සංකල්ප ඇති බැවිනි. කලින් කී පරිදි හුදු ඝෝෂාවක් ලෙස සැලකෙන්නක් වුව ද සංකල්පයකින් තොරව ශ්‍රවනය නොවේ. බෞද්ධ ධර්මයෙහි සඳහන් චක්ඛු විඤ්ඤාණයෙහි ඇති වැදගත්කම එය වෙයි. මනස නොමැතිව චක්ඛු විඤ්ඤාණයක් ඇති නොවේ. මේ විඤ්ඤාණය ඇති වීමට වචනයක් අවශ්‍ය නොවේ. අවශ්‍ය වන්නේ සංකල්පයක් පමණකි. සංකල්පය චිත්ත රූපයක් වෙයි. අවශ්‍ය නම් චිත්ත රූපය වචනයක් හෝ ශබ්ද මාලාවක් මගින් ප්‍රකාශ කළ හැකි ය.

© Prof. Nalin De Silva

සංකල්පයත් සංජානනයත් එකක් අනෙක සමග බැඳී ඇති බව සියල්ල වෙන් කිරීමට උත්සාහ කරන බටහිරයන්ට නොතේරෙයි. සොසූර් විද්වතා හා අනෙක් බටහිර පඬුවන් නිර්මාණය කර ඇති සංඥායකය හා සංඥායිතය යන්න සංජානනය හා සංකල්පය වෙන් කිරීමෙන් තනාගෙන ඇත්තකි. ඔවුන්ට නොතේරෙන කරුණ නම් සංකල්පයක් සඳහා වචන අනිවාර්ය නොවන්නේ ය යන්න ය. වචන ද්විතීයික වෙයි. එහෙත් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි වචනය ප්‍රධාන වෙයි. පරණ තෙස්තමේන්තුව මෙය අවධාරණය කරයි. ලෝකාරම්භයෙහි වචනය (ලොගොස්) විය යනුවෙන් ඒ වැදගත්කම බයිබලයෙහි සඳහන් වෙයි. ලොජික් හෙවත් න්‍යාය යන්න ද බිඳී ඇත්තේ මේ ලොගොස් යන්නෙන් බව තේරුම් ගත්විට බටහිරයන්ට වචනවල ඇති වැදගත්කම කෙතෙක් ද යන්න අවබෝධ විය යුතු ය. මුනිවත රකින මුනිවරුන් භාරතයේ මිස බටහිර පහළ විය නොහැකි ය. භාරතයේ විමුක්තිය ම ඇත්තේ වචනවලින් කිව නොහැකි තත්ත්වයක ය. බෞද්ධයනට නම් මේ තත්ත්වය යන්න ද වැරදි ව්‍යවහාරයකි. එහෙත් බටහිර නම් සියල්ල ආරම්භයෙහි ම වචනය විය. එපමණක් නොව, න්‍යාය වචනයෙන් තේරුම් ගන්නා එකක් විය. නිවන වචනයෙන් විස්තර කිරීමට උත්සාහ ගන්නා ඇතැම් ඔල්කට් බෞද්ධයෝ නිවන ක්‍රිස්තියානි කිරීමට වලි කති.

රතු යන වචනය නිර්මාණය කර ගැනීමේ දී මිනිසුන් විසින් කෙරී ඇත්තේ රතු යන සංජානනය, එනම් චිත්ත රූපය හෝ සංකල්පය හා බැඳුණු වචනයක් සකස්කර ගැනීමකි. රතු යන වචනය හුදු සංකේතයක් නොවේ. ඒ චිත්ත රූපයක් සඳහා ශබ්ද මාලාවක් සකස් කර ගැනීමකි. රතු පාට යමක් දකින විට අප කරන්නේ රතු පාට නිර්මාණය කිරීමකි. රතු පාට යමක් යනුවෙන් අපෙන් තොර දෙයක් නැත. රතු පාට යමක් යන්න ද අපේ නිර්මාණයකි. රතු පාට යන්න අප නිර්මාණය කරන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ගැන අපට අවබෝධයක් නැති බැවිනි. අපේ නිර්මාණය ම අපි රතු ලෙස දකිමු. රතු යන වචනය අපට වචනය තනා ගැනීමට කලින් ද තිබූ, දැන් රතු යනුවෙන් නම් කෙරෙන පාට හා සම්බන්ධ, චිත්ත රූපය සඳහා අප තනාගත් ශබ්ද මාලාවකි. ශබ්ද මාලාවකට හෝ රූප මාලාවකට හෝ ඝන්ධ මාලාවකට හෝ වෙනත් පංචේන්ද්‍රිය ගෝචර මාලාවකට හෝ වචන අනිවාර්ය නොවේ ය යන්න භාෂාව පිළිබඳ නිර්මාණය කෙරෙන සිංහල බෞද්ධ ප්‍රවාදයක මුලින් ම ඇත.

අප මෙහි දී සඳහන් කරන්නේ සෘජු සංජානන ගැන ය. සෘජු සංජානනයක් යනුවෙන් මා අදහස් කරන්නේ පංචේන්ද්‍රියන්ගෙන් ලබා ගන්නා සෘජු විඳීම් (වේදනා) ආශ්‍රිත සංජානනවලට ය. වේදනා, සංඥා, සංඛාර හා විඥ්ඥාණ එකක් අනෙක්වා සමග බැඳී ඇති බව ද අමතක නොකළ යුතු ය. රතු පාට අප දකින්නේ අත් විඳින්නේ, ග්‍රහණය කර ගන්නේ රතු පාට ලෙස ය. මේ සෘජු සංජානන සම්බන්ධයෙන් වචනවලට සංකේත යැයි කිව හැක්කේ වචනයට ඒ සංජානනයේ ගුණය නැත යන අර්ථයෙන් පමණකි. රතු පාට සහ මාර්ග සංඥාවෙහි රතු යන්න අතර වෙනසක් ඇත. සොසූර් විද්වතා හා අනෙක් පශ්චාත්ව්‍යුහවාදීන් නොසලකන මේ වෙනස අපට වැදගත් වෙයි. මාර්ග සංඥාවෙහි රතු දුටු විට අපි ඉන් යම් නිගමනයකට පැමිණෙන්නෙමු. ඒ නිගමනය නම් වාහනය නැවැත්විය යුතු ය යන්න ය. එය නිගමනයකි. සමාජය විසින් අපට උගන්වනු ලැබ ඇති ඒ නිගමනය සමාජය විසින් ම අපට උගන්වනු ලැබ ඇති රතු යන වචනයෙන් වෙනස් වෙයි. අප රතු පාට දකින විට එහි නිගමනයක් නැත. එහි අපෝහනයක්, අනුමානයක් හෝ වෙනත් එවැන්නක් නැත. අපි සෘජුව ම රතු පාට දකින්නෙමු. රතු යන වචනයට රතු යන ගුණය නැති වීම හැරෙන්නට මෙහි දී රතු යන වචනය සංකේතයක් ලෙස ගත හැකි නොවේ. කලින් සඳහන් කර ඇති ආකාරයට රතු යන වචනය සෘජු සංකේතයක් නොවේ.

එහෙත් මාර්ග සංඥාව එසේ නොවේ. එහි දී අපට යම් නිගමනයකට ඒමට සිදු වෙයි. රතු පාට දුටු වහා ම අපි ඉන් හැඟවෙන්නේ, කියැවෙන්නේ වාහනය නැවැත්විය යුතු ය යන නිගමනයට පැමිණෙන්නෙමු. මේ නිගමනය ක්ෂණික යැයි යමකු කීමට ඉඩ ඇත. ක්ෂණික වුවත් නැතත් එය නිගමනයකි. අනෙක් අතට ක්ෂණය යන්න කෙතෙක් කුඩා වුව ද එයට යම් කාලයක් ගතවෙයි. මා තේරුම් ගන්නා ආකාරයට ථේරවාදී බෞද්ධ ධර්මයෙහි ක්ෂණය යන්නෙන් කියැවෙන තැන්හි අඩුම කාල ප්‍රාන්තරයක් ගත වන්නේ චිත්තක්ෂණයකට ය. චිත්තක්ෂණයක් යනු චිත්තයක් පවතින කාලයයි. මෙහි චිත්තය පවතින කාලය යනු මිනිස් මනස විසින් නිපදවනු ලැබ ඇති තවත් සංකල්පයක් පමණකි. එහි දී ද සිදුවන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අනාවබෝධයෙන් මිනිසා චිත්තක්ෂණය යනුවෙන් සංකල්පයක් නිර්මාණය කිරීම ය. ඇති වීම, පැවතීම හා නැති වීම ද සංකල්ප පමණකි. මිනිස් මනසට ගත හැකි, එනම් ග්‍රහණය කරගත හැකි

© Prof. Nalin De Silva

කුඩා ම කාල ප්‍රමාණය (එය ද මිනිසාගේ ම නිර්මාණයකි!) චිත්තක්ෂණය ලෙස අභිධර්මාචාර්ය වහන්සේලා විසින් නිර්මාණය කෙරී නම් කෙරී ඇත. එයට අඩු කාල ප්‍රාන්තරයක් ගැන අපට සිතා ගත නොහැකි ය. එනම් එයට අඩු කාල ප්‍රාන්තරයක් මිනිස් මනසට ග්‍රහණය කර ගත නොහැකි ය. බටහිර භෞතික විද්‍යාඥයෝ ප්ලෑන්ක් කාලය නම් කාල ප්‍රාන්තරයක් ගැන ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි දී සඳහන් කරති. එය තත්පරයකින් දහයේ තිස්පස් වැනි බලයෙන් කොටසකි. ($10^{-35}$ ) මේ කාල ප්‍රාන්තරය අද බටහිර භෞතික විද්‍යාඥයන්ට ක්වොන්ටම් අංශු සම්බන්ධයෙන් දිය හැකි අවම අගය වෙයි. නිව්ටෝනීය භෞතික විද්‍යාවෙහි මෙහි ශූන්‍ය කාල ප්‍රාන්තරයක් ගැන ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි දී සඳහන් කළ හැකි නොවේ. ථෙරවාදී බෞද්ධ ධර්මයෙහි කියැවෙන චිත්තක්ෂණය පමණක් නොව චිත්තය ද මිනිස් මනසේ නිර්මාණයකි. අනෙක් අතට කලින් සඳහන් කර ඇති සිංහල බෞද්ධ මනස නම් ලිපියෙහි සඳහන් කර ඇති ආකාරයට, මනස යන්න චිත්තය යන්න උපයෝගී කරගෙන අවබෝධ කර ගත හැකි ය. මේ චක්‍රීය චින්තනය යි.

මාර්ග සංඥාවෙන් පමණක් නොව රතු පාට යන වචනයෙන් ද යමක් හැඟවෙන්නේ යැයි ඇතැම්හු කියති. සොසූර් විද්වතා අයත් වන්නේ ඒ ගණයට ය. එහෙත් මෙය වැරදි ය. රතු පාට දුටු විට, එනම් අප රතු පාට යන සංජානනය (හා සංකල්පය) ලබා ගත්විට අපට ක්ෂණික ව හෝ නිගමනයකට පැමිණීමට අවශ්‍ය නොවේ. රතු පාට අපට හඟවන්නේ රතු පාට ය! දැන් රතු යන වචනය සලකන්න. ඒ වචනයෙන් කුමක් හැඟවෙයි ද? වචනය හුදු සංකේතයක් නොවී ඉන් හැඟවෙන්නේ ද රතු පාට ම ය. රතු යන වචනය ඇසුණු විට අපි ඉන් රතු යනුවෙන් නිගමනයක් ලබා නොගන්නෙමු. අපට එහි දී තර්ක කිරීමට හෝ වෙනත් දත්ත උපයෝගී කර ගැනීමට හෝ අවශ්‍ය නොවේ. යම් කිසිවකුට අනුව රතු යන වචනයෙන් රතු පාට හැඟවෙන්නේ, කියැවෙන්නේ වචනය සංකේතයක් ලෙස ගැනීමෙන් යැයි සිතමු. එවිට ඒ අයගෙන් අප ඇසිය යුත්තේ රතු යන වචනයෙන් රතු පාට යන්න හැඟවෙන්නේ කෙසේ ද යන්න ය. එයට තවත් වචන අවශ්‍ය ද? එසේත් නැත්නම් රතු යැයි කී විගස වෙනත් අතරමැදි තර්ක නැතිව රතු යන චිත්ත රූපය මැවෙන්නේ ද? එය එසේ නම් රතු යන වචනය රතු යන චිත්ත රූපය සමග බැඳී ඇත. දැන් යමකු කිව හැක්කේ රතු යන මාර්ග සංඥාව දුටු විගස ද වාහනය නැවැත්විය යුතු ය යන්න හැඟවෙන බව ය. රතු පාට දුටු විට වාහන නැවැත්වීමට අපි දැන් පුරුදු වී සිටිමු. එහෙත් රතු යන වර්ණය දුටු විට අප වාහන නැවැත්විය යුතු ය යන නිගමනයට පැමිණෙන්නේ වෙනත් වචන යොදා ගනිමිනි. මහ මග හැරෙන්නට වෙනත් තැනක රතු පාට දුටු විට අපට වාහන නැවැත්වීමට මතක් නොවෙයි. ඒ සඳහා, එනම් එවැනි තැනක වාහන නැවැත්වීමට, සමාජයෙන් කෙරෙන බලපෑමක් නැත. මාර්ග සංඥාවෙහි රතු හා රතු යන වචනය අතර වෙනසක් ඇත. පළමුවැන්න සංකේතයකි. දෙවැන්න එවැනි සංකේතයක් නොවේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva